**ස්වාධීන වෙරළ සංරක්ෂණ සංගමය එ. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාතර්මේන්තුව**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/84/2018 (2018.03.27 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී අනුමත කරන ලද නියෝගය)

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කායර්පටිපාටිය) රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන පටිපාටිය වාතර්ා කිරීම.

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලී පින්ටෝ ජයවධර්න මෙනෙවිය
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම
**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්සරණසිංහ

**අභියාචක** - ස්වාධීන වෙරළ සංරක්ෂණ සංගමය
නොතීසිලත්පාශර්වය **-** බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීතර්, වැ.බ. **අධ්‍යක්ෂක** ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාතර්මේන්තුව

**පෙනීසිටීම**
අභියාචක සංගමය - ජේ ඒ සුසිල් කුමාර
සුදත් හේමචන්ද්‍ර

පොදු අධිකාරිය - බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීතර්, **අධ්‍යක්ෂක** ජනරාල්
**රංගන ප්‍රනාන්දු අධ්‍යක්ෂක වැ. බ.**
**පංචාලි ක... නීති නිලධාරිනි**

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය: | 2017.08.31 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 2017.10.02 |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය: | 2017.10.19 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 2017.11.02 |
| RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය: | 2017.12.12 |

අභියාචනයට පසුබිම්වූ කරුණු:

අභියාචක සංගමය 2017.08.31 දිනැති ඉල්ලීම මගින් 'MN-01-2006A වැටුප් පරිවර්තනය සඳහා තුඩු දුන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්ගේ සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිදෙර්ශ හා නිරීක්ෂණ ඇතුලත් ලේඛනය(ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මේ මත පදනම්ව 'සහකාර කළමනාකාර - තාක්ෂනික් නොවන අංශය සඳහා වැටුප් පරිවතර්න නිදෙර්ශ කොට තීරණ ගන්නා ලදී) ඉල්ලා සිටින ලදී.

තොරතුරු නිලධාරියා/ පොදු අධිකාරිය 2017.10.02 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ පොදු අධිකාරිය මගින් පවත්වාගෙන යන ගොනුව තුල මෙම කරුණට අදාළ නිදෙර්ශ හා නිගමන ඇතුළත් ලේඛනයක් නොමැති බවයි. අභියාචක සංගමය මෙම පිළිතුරින් සෑහීමකට පත් නොවූ බැවින් 2017.10.19 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමුකරන ලදී. මෙයට නම්කළ නිලධාරයාද තොරතුරු නිලධාරියාගේ පිළිතුරම සපයන ලදී. ඉක්බිතිව අභියාචක 2017.12.12 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය විභාග කිරීමේ අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක ලියාපදිංචි සේවක සංගමයක් වීම හේතුවෙන් පනතේ 24(1) සහ 43 වගන්තිය සමඟ කියවන ලද 3 වගන්තිය ප්‍රකාරව පුරවැසිභාවය සඳහන් කිරීමට අවශ්‍ය බව අවධාරණය කරන ලදී (TISL එ. අග්‍රාමාත්‍ය කායර්ාලය / ජනාධිපති ලේකම් කායර්ාලය(RTICAppeal/05/2017 & RTICAppeal/06/2017, RTIC සටහන් 2018.02.23)). අභියාචක සංගමය තම තොරතුරු ඉල්ලීමෙහි පුරවැසිභාවය සඳහන් කොට නොතිබූ අතර, කොමිෂන් සභාව ඉදිරියේදී පුරවැසිභාවය සඳහන් කර සිටීම ප්‍රමාණවත් පොදු අධිකාරියෙහි එකඟතාවය සහිතව සටහන් කරන ලදී.

අභියාචනා විභාගයේදී, අභියාචක විමසා සිටින තොරතුරු තම සන්තකයේ නොමැති බව පොදු අධිකාරිය අඛණ්ඩව ප්‍රකාශ කර සිටියද, අභියාචක සංගමය, කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින්, මහවැලි සංවර්ධන හා පරිසර ලේකම් වෙත, ලියන ලද 2015.03.23 දිනැති අංක DMS/1185 දරණ ලිපිය ඉදිරිපත් කරමින් පවසා සිටියේ, මෙම 2015.03.23 දිනැති අංක DMS/1185 දරණ ලිපිය මාගර්යෙන් ලේඛනය පවතින බව තහවුරු වන බවයි. පොදු අධිකාරිය තවදුරටත් පවසා සිටියේ මෙම නිලධාරීන්ට අදාළ වැටුප් පරිවතර්නය ලබා නොදුන් බවයි.

පොදු අධිකාරියෙන් එම අවස්ථාවේදී විමසා සිටියේ කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුවෙන් මෙම නිරීක්ෂණ හා නිගමන තිබේද යන්න පිළිබඳව සොයා බලා ඇත්ද යන්නයි (මන්ද මෙම ලේඛනය පවතින බවට තහවුරු වන 2015.03.23 දිනැති අංක DMS/1185 දරණ ලිපිය කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුවෙන් නිකුත් කරන ලද ලිපියක් වන බැවින්). මෙයට පොදු අධිකාරිය පවසා සිටියේ එසේ සොයා බලා නොමැති බවයි.

**නියෝගය:**

පොදු අධිකාරිය මුල් අවස්ථාවේදී තොරතුරු ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුව වෙත යොමු කර නොමැත්තේ පොදු අධිකාරියම එම ලේඛනය(MN-01-2006A වැටුප් පරිවර්තනය සඳහා තුඩු දුන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්ගේ සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිදෙර්ශ හා නිරීක්ෂණ ඇතුලත් ලේඛනය) තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බව පවසා සිටීම නිසා බව පැහැදිලි වේ. කෙසේ හෝ, 2015.03.23 දිනැති අංක DMS/1185 දරණ ලිපිය මාගර්යෙන් ලේඛනය පවතින බවට ඇඟවෙන බැවින්, පොදු අධිකාරියට, මෙම නිරීක්ෂණ හා නිගමන පවතීද යන්න පිළිබඳව,

කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුවෙන් සොයා බලා කොමිෂන් සභාවට දන්වන ලෙසට නියෝග කර සිටිමු.

අභියාචනය මෙයින් කල් තැබේ.

මීළඟ විභාග කිරීම: 2018.05.15